අසභ්‍ය වීඩියෝ දර්ශන සහ ඡායාරූප මුදලට අලෙවි කිරීමේ චෝදනාව පිට, චීවරධාරියකු සහ ඊට අනුබල දුන් බව කියන කුලී රථ රියදුරෙකු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමේ පුවතක්, පුවත්පත් තුළ ප්‍රමුඛ අවධානයකට ලක් වී තිබිණි.

එසේම මෙම අසැබි වීඩියෝ දර්ශන හා ඡායාරූප අතර, කුඩා දරුවන් සහිත වීඩියෝ හා ඡායාරූප ද තිබූ බව, ඇතැම් මාධ්‍ය වාර්තා කරයි.

සැප්තැම්බර් 25 සහ සැප්තැම්බර් 20, 2023 දිනයන්හි තෝරාගත් සිංහල පුවත්පත් තුළ සිරස්තල ඔස්සේ මේ සම්බන්ධයෙන් වාර්තා වී තිබූ ආකාරය පහත පරිදි දැක්විය හැක.

ඔබ සිතන ලෙසට,

මෙම සිදුවීමෙහි බරපතළ භාවය මනාව සන්නිවේදනය වන පරිදි, තොරතුරු ඉදිරිපත් කරමින් පුවත වාර්තා කර තිබූ සිරස්තලය(ය) ලෙසින් ඔබ තෝරා ගන්නේ කුමන වාර්තාව(න්) ද?

